
# පැළෑටි බද්ධ කිරීම

විවේක කාලයේ දී අත්හදා බැලිය හැකි කෘෂි කාර්මික කටයුතු පිළිබඳව ලිපි පෙළක් පටන් ගන්නා ලෙස අපේ පාඨකයින් බොහෝ දෙනෙකු ඉල්ලා සිටියහ. එම ඉල්ලීමට පිළිතුරක් ලෙස මෙම ලිපිය පළ කරනු ලැබේ. අද පළමුවෙන් ඉදිරිපත් කරන්නේ ටී බද්ධය පිළිබඳ කරුණුයි. මේ පිළිබඳව යම් කරුණක් පැහැදිලි කිරීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව සංස්කාරක වරයාගෙන් විමසන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.





1 රූපය.

බද්ධ කිරීම ගැන කතා කරන විට මව් ශාකය සහ ග්‍රාහක ශාකය ඉතා වැදගත් තැනක් උසුලයි. මව් ශාකය යනු තමන් බෝ කිරීමට බලාපොරොත්තුවන ශාකය වන අතර, ඉන් ලබා ගන්නා අංකුරය 'අනුජය' වශයෙන් හඳුන්වමු. ග්‍රාහක ශාකයෙන් ''අනුජය'' සවි කිරීමට ගන්නා 'ග්‍රාහකය' ලබාගනී. ග්‍රාහක ශාකය හොඳින් පරිසරයට අනුවර්ථනය වී ඇති හොඳ මූල පද්ධතියක් ඇති ශාකයක් විය යුතුය. (උදා: මව් ශාකය දොඩම්, ග්‍රාහක ශාකය – නාරන්, දෙහි)

වානිජ වශයෙන් බද්ධ කිරීමේ දී ග්‍රාහක ශාක බීජ තවාන් මගින් ලබා ගත හැක.

**බීජ තවානක් සාදා ගැනීම**


1 රූපයේ දක්වා ඇති ප්‍රමාණයට පොලිතීන් කවර සදා ගන්න. ඉන්පසු එයට කොම්පෝස්ට් පොහොර මිශ්‍රණයක් පුරවා යටින් සිදුරු කීපයක් තබන්න. මෙම බෑග වල ග්‍රාහක ශාකයේ බීජ




පැල කරන්න මේවායින් ඇතිවන පැල පැන්සලක් තරම මහත් වූ පසු බද්ධ කිරීම සඳහා භාවිතා කළ හැක.

'ටී' බද්ධයට අවශ්‍ය උපකරණ:

1. බද්ධ පිහියක් 2. බද්ධ පටි (පොලිතීන් පටි භාවිතා කළ හැක.) ක්‍රමය: (බද්ධ කිරීම සඳහා හොඳම වේලාව උදය හෝ සවස් කාලයයි




1. අනුජය වෙන්කිරීම.

මව් ශාකයේ මද වශයෙන් මෝරන ලද, ගැට රහිත කොටසකින් නිරෝගී අංකුරයක් බද්ධ පිහියආධාරයෙන්. වෙන්කර ගන්න. 2. රූපයේ දක්වා ඇති ආකාරයට පිහිය අංකුරයට යටින් තබා රූපයේ පෙනෙන අන්දමට උඩ අතට කපන්න. මෙය මද පරිස්සමින් කළ විට ලී පතුරක් සමඟ අනුජය වෙන් වී ආ හැක. එවිට ලී පතුර සෙමින් ඉවත් කළ යුතුය.

2. ග්‍රාහකය පිළියෙළ කිරීම:

පොළවේ සිට ග්‍රාහක ශාකයේ අඟල් 6 ක් හෝ 8 ක් ඉහළින් බද්ධ පිහිය ආධාරයෙන් 'ටී' අකුරක හැඩයට පැලුමක් ඇති කරන්න. ඉන්පසු පිහියා තුඩ ආධාරයෙන් පැලුමේ පොත්ත 3 රූපයේ දැක්වෙන ආකාරයට පළල් කරන්න. මෙහි දී ලියට හානියක් නොවන ලෙසට විශේෂයෙන් පරිස්සම් විය යුතුය.

3. බද්ධය පිළියෙළ කිරීම.

දැන් අනුජය ග්‍රාහක පැලුමේ හොඳින් තද වී සිටින ලෙස ඇතුල් කරන්න. මෙහි දී අනුජය තරමක් දිග වැඩි වූ විට එය ඉහළින් වැඩිපුර පිටතට පැමිණ තිබිය හැක. එය ප්‍රවේශමෙන් කපා ඉවත් කරන්න. ඉන්පසු බද්ධ පටි ආධාරයෙන් පහළ සිට ඉහලට හොඳින් තදවන සේ වෙලා ඉහළින් ගැටයක් දමන්න.

සති තුනකට පමණ පසු වෙලුම ඉවත් කර බැලූ විට බද්ධය කොළ පැහැයෙන් දිස් වේ නම්, එය සාර්ථක බද්ධයක් බව පැහැදිලිය. මෙහි දී නැවත අංකුරය පිටතට සිටින සේ බද්ධ පටියෙන් වෙලිය යුතුය.

අංකුරයේ ප්‍රරෝහණය උත්තේජනය කිරීම සඳහා ග්‍රාහිකයේ බද්ධයට ඉහළින් ඇති කොටස බද්ධයට අඟල් 2 ක් හෝ තුනක් ඉහළින් 45 පමණ ආනතියක් සිටින සේ කපා හැරිය හැක. මෙම කැපුමේ 'තාර' වැනි ආලේපයක් කිරීමෙන් ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඇතිවන හානිය වළක්වා ගත හැක.

අංකුරය හොඳින් වැඩුනු පසු පොලිතීන් බෑගය ඉවත්කර ක්ෂේත්‍රයේ සිටුවා ගත හැක.

'ටී' බද්ධ ක්‍රමය විශේෂයෙන් දොඩම් (සිට්‍රස්) පවුලේ පළතුරු වර්ග බද්ධ කිරීම සඳහා සුදුසු බද්ධ ක්‍රමයකි.

ඩබ්ලිව්. සුසන්ත විජයකුලතිලක
ජා. තා. ඩි. (කෘෂිකර්මය.)